# දේශමාන්‍යලා සහ වීරෝදාරලා

සක්විති රණසිංහ සහ දඬුවම් මුදලාලි ගේ හොර බැංකුවලින් ජනතාවගේ මුදල් සොරාගෙන පිල්බෝල් ගසන යුගයට එකතුවන අළුත්ම මුදලාලි කවුරුදැයි ඇසුවොත් එයට පිළිතුරු දැන් ඔබ ළඟ ඇත. ඒ දේශමාන්‍ය ලලිත් කොතලාවලයි. ඔහුට කලක් මාධ්‍යවලින් ඇමතුවේ මැතිතුමා ලෙසය. එසේම අතීතයේදී කලක් ඔහු උතුමාණන් වෙන්නට ද ආසන්නව සිටියේය. නමුත් දැන් ඔහු මාධ්‍යවලට නිකම්ම නිකම් කොතලාවල කෙනෙක් පමණි. ලෝකයේ කොතරම් ආරක්ෂක උප්‍රක්‍රම තිබෙනවා කියා පුරසාරම් දෙඩුවත්, වංචාකරුවන්ට මිනිමරුවන්ට සල්ලි තිබේනම් ඒ ඕනෑම උප්‍රක්‍රමයකින් ගැලවිය හැක. කිසිම ජගතෙකුට අල්ලා ගැනීමට බැරිවන සේ සක්විති රණසිංහ රටින් පැනගත්තේ කෙසේදැයි තවමත් රහසකි. මේ මොහොත වනතුරුම අනුන්ගේ මුදල්වලින් වෙනත් රටක සැපවත් ජීවිතයක් ගතකරන සක්විති මඟින් අපේ රටේ සැඟවී යාමට තිබූ තවත් වංචාකරුවන්ගේ රහස් රැසක් එළියට පැන්නේය. සක්විති වුවද තව ටික කාලයක් මෙම ව්‍යාපාරය මෙලෙස කරගෙන ගියානම් ඔහුද දේශමාන්‍ය කෙනෙකු වෙනවා නොඅනුමානය.

දකුණේ අහිංසක මිනිස්සුන්ගේ සේම ධනවත් මිනිසුන්ගේ ද මුදල් වලින් සුපිරි ජීවිතයක් ගතකළ දඬුවම් මුදලාලි අද දඬුවම් විඳීමට ආසන්නව සිටියි. තවමත් රිමාන්ඩ් භාරයේ පසුවන දඬුවමට වඩා අද දඬුවම් විඳින්නේ එදා ඔහු ළඟ මුදල් තැම්පත් කළ අසරණ මිනිසුන්ය. ඔවුන් අද යන එනමං නොමැතිව මහපාරට වැටී ඇත. දඬුවම්ගේ නිවසේ උළු ගලවා දේපළ විනාශ කළ තැම්පත්කරුවන්ට දඬුවම්ට අද දෙන්නට ඇත්තේ කුමක්ද ? ඇඟලා ඇති ඇඳිවත පමණි.

ගෝල්ඩන් ක්‍රෙඩිට් සමාගම හරහා මුදල් වංචාවක අසුවූ ලලිත් කොතලාවල ප්‍රභූ පරපුරකට

එසේම එදා සිට අද දක්වා කොතලාවල වටා සිටි ඔහුගේ අධ්‍යක්ෂක මණ්ඩලය ඇතුළු ඉහළ නිල දරන්නන් ද ඔහුට හොරා ආයතනවලින් හොරකම් කළෝය. වරක් මිඩ්ල්වේ සමාගමේ සිටි ආයතන ප්‍රධානියක් මිඩ්ල්වේ සමාගමෙන් හොරකම් කළ මුදල්වලින් ඔහු මුද්‍රණාලයක් ආරම්භ කළේය. එහෙත් කුඩා සේවකයන්ට සොරකම් කිරීම වෙනුවෙන් තදින් සිටි කොතලාවල ඔවුන් සේවයෙන් නෙරපා දැමුවේ, සොරකම් කිරීම මිනිමැරුමක් සේම බලවත් වරදක් බව ප්‍රකාශ කරමිනි. අද ලොකුම සොරකම් කිරීම කර ඇත්තේ කොතලාවලයි.

ගෝල්ඩන් කී ක්‍රෙඩිට් සමාගම හරහා වංචා කළ මුදල්වලින් කොටසක් තැම්පත් වි ඇත්තේ ඕස්ට්‍රේලියාවේ මූල්‍ය සමාගමකය. රටටත් හොරා මෙරටට මුදල් පොම්ප ගැසූ ඔහුගේ අරමුණ වන්නට ඇත්තේද ප්‍රශ්නයක් ඇති වුවහොත් කලක් වෙන රටක වාසය කිරීම විය හැක. දැන් ඒ මුදල් නැවත ගෙන ගෝල්ඩන් කී ක්‍රෙඩිට් සමාගම හරහා තැම්පත් කරුවන්ට ගෙවීමට ඔහුට උවමනාව තිබුණද නීත්‍යානුකූලව එසේ කළ නොහැක. එසේ වුවහොත් රටේ මූල්‍ය වෙන රටකට පොම්ප කළේ කෙසේද යන්න නීතිය දැනගනු ඇත. එවිට ඔහුට ඒ විනිමය වංචාව වෙනුවෙන්ද දඬුවම් විඳීමට සිදුවනු ඇත. අද ඔහුගේ ආයතනවලට ජනතාව ඇදෙන්නේ නැත. ඒවායේ ව්‍යාපාර ප්‍රවර්ධනය ලොක් වී ඇත. සෙලින්කෝ ඉන්ෂුවරන්ස් නැමැති ලාභදායී ව්‍යාපාරය පමණක් තවමත් ඇදීයන අතර අනෙක් සමාගම් කඩාවැටෙන තත්වයේ ඇත. ඒ නිසා ඒවායේ රැකියාවේ යෙදෙන පිරිස් දිවි ගෙවන්නේ අපේක්ෂා භංගත්වයෙනි. මේ අවස්ථාවේ ඒවාද කඩා වැටුණොත් රජයක්




## කුට්ටම් පොකුණ



ඔහු නමින් අසා සිටියත් රුවින් නම් මේ පන්නිපිටිය බව ඒ ජනතාව දැන සිටියේ නැත.

අද දේශමාන්‍ය සහ වීරෝදාරලා සොරුන් බවට පත් වී ඉතිහාස ගතවන යුගයක රට වෙනුවෙන් සටන් කරන අහිංසක යුධ සෙබලුන් තවමත් රට වෙනුවෙන් සටන් කරයි. දේශමාන්‍ය, වීරෝදාර පට්ටම් හිමිවිය යුතු උතුරේ සටන් වදින් අහිංසක වීර සෙබලුන් කිසිම ප්‍රසිද්ධියක් නොමැතිව තම දිවිය පුදති.

මේ සියළු කාරණා සළකා බැලීමේදී අපිට මතක් වන්නේ සීහ චම්ම ජාතකයේ එන සිංහ හමක් පොරවා ගත් කොටළුවා පිළිබඳවයි. සිංහයෙකු ලෙස සිතා හම පොරවාගෙන සරු කෙත්වතු සූරා කෑ කොටළුවා ජනතාවගෙන්ම මැරුම් කෑවේය. කෙනෙක් තමන්ගේ සැබෑ තත්වය කෙසේ හෝ හංගාගෙන අනුන් රැවටීමට උත්සහකළත් එය කළ හැක්කේ ටික කාලයකට පමණි. එය කවදාක හෝ අනාවරණය වනු ඇත. එය රටේ නායකයාගේ විපක්ෂ නායකයාගේ

අයත්වන පුදගලයෙකි. කොතලාවල පරම්පරාවෙන් පැවත එන ඔහු පරම්පරාගත ධනපතියෙකි. එදා කොතලාවල පරපුර මෙරටට කළ එලි බැස්සේ මිනිරන් පතල් හා තේ වතු හරහාය. සුද්දන්ට කත් ඇද ඔවුන්ගෙන් ලබාගත් ඉඩකඩම් හා මිනිරන් පතල් හරහා තම වංශවත් භාවය ඔපමට්ටම් කරගත් කොතලාවල පරපුර එදා අප රටේ අහිංසක ජනතාවගේ ශ්‍රමය සූරා කෑවේය. ඔවුන් ලේ දහඩිය මතින් අශ්වයන් දැක්කූ කළු සුද්දන් අතරට කොතලාවල පරපුරද එකතුවූයේ එලෙසය.

ලංකාවේ උසම ගොඩනැගිල්ල ලෙසට එදා හිමිකම් කිවූ සෙලින්කෝ ගොඩනැගිල්ල හරහා සෙලින්කෝ සමුහ ව්‍යාපාර වත්කම්වලට හිමිකම් කිවූ කොතලාවල පැරණිම ව්‍යාපාරය වූයේ ද ෆිනෑන්ස් සමාගමයි. ඊටපසු ඔහු සහ ඔහුගේ අධ්‍යක්ෂක මණ්ඩලය මිඩ්ල්වේ සමාගම නැමැති මුද්‍රණ සමාගම හරහා මුද්‍රණ කටයුතුවලට ද අත තැබීය. සිලාන් බැංකුව, සෙලින්කෝ ඉන්ෂුවරන්ස්, සෙලින්කෝ ඇඩ්වටයිසින් ගෝලඩන් කී ක්‍රෙඩිට් ආදී විශාල සමාගම් රැසකට පසුව හිමිකම් කිවූ ලලිත් කොතලාවල සහ ඔහුගේ බිරිඳවන සිසිලියා කොතලාවල ඇතුළු සගයන් අපරටේ ආර්ථික ප්‍රවාහයට විශාල බලවේගයක් විය. ඔහුගේ ව්‍යාපාරවල බොහෝවිට උසස් තනතුරු දැරුවේ අපරටේ උසස් යැයි සම්මත විද්‍යාලවල දරුදැරියන්ය. ක්‍රිස්තියානි පල්ලි හරහාද ඔහුගේ ආයතනවල රැකියා ලබාගත් පිරිස බොහෝ සිටියේය. මේ සියලු පිරිස්වලට රැකියා දීමට තරම් ශක්තිමත්ව සිටි කොතලාවල අප රටේ රැකියා වියුක්තිය පහත හෙළීමට තරම් ශක්ති සම්පන්න වූ බලවේගයක් ලෙස එදා ක්‍රියා කළේය. සක්විති නිසා අනාථ වූ තැම්පත්කරුවන්ගේ මුදල් තමාට ලබාදිය හැකි බවත් ඒ වෙනුවෙන් මහ බැංකුව සමඟ එකතු වී මේ ප්‍රශ්නය විසඳිය හැකි බවත් කට ා කළ කොතලාවල අද සිටින්නේ බන්ධනාගාරයේය. ඔහුගේ බිරිඳ රටින් පැන ගොස්ය. ගෝල්ඩන් කී ක්‍රෙඩිට් සමාගම හරහා මුල්‍ය වංචා කළ ඔහු හා ඔහුගේ බිරිඳ පූරනය කටයුතු සඳහා මුදල් වියදම් කර ඇත්තේ ජනතාවගෙන් වංචා කළ මුදල්වලිනි.

***ගෝල්ඩන් කී ක්‍රෙඩිට් සමාගම හරහා වංචා කළ මුදල්වලින් කොටසක් තැම්පත් වි ඇත්තේ ඕස්ට්‍රේලියාවේ මූල්‍ය සමාගමකය. රටටත් හොරා මෙරටට මුදල් පොම්ප ගැසූ ඔහුගේ අරමුණ වන්නට ඇත්තේද ප්‍රශ්නයක් ඇති වුවහොත් කලක් වෙන රටක වාසය කිරීම විය හැක. දැන් ඒ මුදල් නැවත ගෙන ගෝල්ඩන් කී ක්‍රෙඩිට් සමාගම හරහා තැම්පත් කරුවන්ට ගෙවීමට ඔහුට උවමනාව තිබුණද නීත්‍යානුකූලව එසේ කළ නොහැක. එසේ වුවහොත් රටේ මූල්‍ය වෙන රටකට පොම්ප කළේ කෙසේද යන්න නීතිය දැනගනු ඇත. එවිට ඔහුට ඒ විනිමය වංචාව වෙනුවෙන්ද දඬුවම් විඳීමට සිදුවනු ඇත. අද ඔහුගේ ආයතනවලට ජනතාව ඇදෙන්නේ නැත. ඒවායේ ව්‍යාපාර ප්‍රවර්ධනය ලොක් වී ඇත.***

පැත්තෙන් සිදුවන අවාසියද සුළුපටු නොවේ. තවත් රැකියා වියුක්තිකයන් ශ්‍රම බලකායට එකතුවනවා යනු රට තව තවත් බංකොලොත් වීමකි. එම නිසා එම ව්‍යාපාර ඇදගෙන යාමට මහ බැංකුව මැදිහත් වී ඇත. වරක් එක්තරා රජයක් කොතලාවලට දේශමාන්‍ය තනතුර පිරිනැමුවේය. එසේම ඔහු ඇතුළු බිරිඳ අසරණයන්ට සරණවීමේ වැඩසටහනක් ද ආරම්භ කර ඔවුනට පිහිට විය. එසේම ඔහු ඇමති කෙනෙක් වීමට ආසන්නව සිටියේය. පත්කළ මන්ත්‍රීවරයෙක් ලෙස පාර්ලිමේන්තුවට ඒමට සිටියේය. එහෙත් මේවා සියල්ල ඔහුට ලැබුනේ ජනතාවගේ මුදල්වලින් බව ජනතාවද දැන සිටියේ නැත. අසරණයන් ඔහුට පිං දුන්නේ මේ කිසිවක් නොදැනය. අද ඔහු වටා සිටි, ඔහුට අනුග්‍රහය දැක්වූ ඔහු ළඟ මුදල් තැම්පත් කළ පුද්ගලයන් එදා පිං ප්‍රාර්ථ නා කළ අත්වලින්ම ඔහු අත්අඩංගුවට පත් වූ පසු අත්පොළසන් නගන්නේ රජකම් කළත් කළකම් පළ දේ යන මහඟු පිරුළ සිහිකරමිනි. ප්‍රධානපෙළේ කතෝලික පූජකවරු වෛද්‍යවරුන් ඇතුළු දේශපාලඥයන් විශාල ප්‍රමාණයක් ගෝල්ඩන් කී ක්‍රෙඩිට් සමාගමේ මුදල් තැන්පත් කළේ ඔහුට තිබූ විශ්වාසය හරහාය. අද ඒ සියල්ල වතුරේය. සමහරවිට ඔහුගේ බිරිඳ ඔහුට කිසිදාක දකින්නට නොලැබෙනු ඇත. ජීවිතයේ අවසාන කාලයේ විශ්‍රාම සුවයෙන් දිවිගෙවන්නට සිටි කොතලාවල පරපුරේ ප්‍රබල පුරුකක් වන ලලිත් කොතලාවලට සිර ගෙදර විශ්‍රාම සුවය ගතකරන්නට සිදුවේවියයි කිසිවකු සිතුවේ නැත.

එසේම නිදන් හොරෙකු ලෙස සිරගෙදරට එක් වන්නට යන පුද්ගලයා පිළිබඳවත් කුට්ටම් පොකුණේ යමක් ලිවිය යුතුය. එදා තොප්පිගල වීරයා ලෙස විරුදාවලිය ලත් පරාක්‍රම පන්නිපිටිය නැමැති වීරෝධාර සෙන්පතියා අද ඒ මව්බිමේ ද්‍රෝහියෙකු ලෙස අත් අඩංගුවේ පසුවෙයි. ඒ නිදන් හොරෙකු ලෙසය. එදා තොප්පිගල සටනේදී ඔහුගේ වික්‍රමාන්විත ක්‍රියාකාරකම් ගැන පත්තර පිටු වර්ණවත් වුයේ පොල්ගෙඩි අකුරෙනි. අද ඔහු නිදන් හාරන්නට ගිය මං පහරන්නෙකු ලෙස වර්තමානයට එකතු වී ඇත. සමහර විට ජාතික වීර මට්ටමේ සිටි පරාක්‍රම පන්නිපිටිය සිතන්නට ඇත්තේ මෙරටේ ඉතිහාසගත මිළකළ නොහැකි පුරාවස්තු ඇතුළු ධනය අයිති වන්නේ ජාතික වීරයන්ට කියාය. ඒවා තමන්ගේ පෞද්ගලික බූදලය කරගෙන සුබ විහරණය විඳින්නට ඇති පරම අයිතිය තමාටද ඇති බව ඔහුගේ මනසේ ලියැවී තිබෙන්නට ඇත. අන්තිමේදී ඔහු ජාතික වීර ප්‍රණාම පුදකළ අහිංසක ජනතාවගේම දෑත්වලින් අල්ලාගෙන පොලිසියට බාරදෙන තුරු,

ලලිත් කොතලාවලගේ, පරාක්‍රම පන්නිපිටිය සේම සෑම දෙනාටම පොදු කාරණයකි. බොරුවෙන් වංචාවෙන් සැමදාම දිවි ගෙවිය නොහැක. එය ලෝකයා ඉදිරියේ කවදා හෝ අනාවරණය වන බව සීහ චම්ම නොහොත් සිංහහම ජාතකයෙන් අපට දෙන වැදගත් පණිවිඩයකි.

ලක්ෂමන් කොඩිතුවක්කු

MC
CURTAINS AND BLINDS

"Manufactures Of Quality
Window Design Service"

Specialists in:
Vertical blinds
Holland blinds
Sun Screens
Micro Venetians
Timber Venetians
Decorative Tracks
Roman blinds
Padded Pelmets
Swags and Tails
Eyelet Curtains

Free Measure and Quote call
MANORI
Ph:(03)87906690
Mob: 0430045331